# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

**ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෘතීය පරීක්ෂණය (බාහිර) - 2011/2012**
**2014 අප්‍රේල්/ මැයි/ ජූනි**

**මානවශාස්ත්‍ර පීඨය**

**බෞද්ධ සංස්කෘතිය - BUCU E 3015**

**බෞද්ධ සංස්කෘතියේ ශ්‍රී ලාංකේය වර්ධනය හා ආසියානු ව්‍යාප්තිය**

**කොටස් දෙකෙන් ම ඇතුලත් වන පරිදි <u>ප්‍රශ්න පහකට (05)</u> පිළිතුරු සපයන්න.**

**ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි** | **කාලය : පැය 03 යි**

---

**<u>1 කොටස</u>**

01. ලක්දිවට බුදුසමය හඳුන්වා දෙන විට මෙරට පැවති ආගමික පසුබිම පිළිබඳ මූලාශ්‍රයාගත තොරතුරු ගෙනහැර දක්වන්න.

02. මහින්දාගමනයේ ඓතිහාසිකත්වය සාහිත්‍යය හා පුරාවිද්‍යාත්මක සාධක ඇසුරින් සනාථ කරන්න.

03. බුදුසමය ලක්දිව රාජ්‍ය ආගම බවට පත්වීමේ පසුබිම හඳුන්වා මෙරට සිටි රජවරුන් එම වගකීම නිසියාකාරව ඉටු කළ ආකාරය නිදසුන් කිහිපයක් ඇසුරින් සාකච්ඡා කරන්න.

04. ශ්‍රී ලාංකේය භික්ෂු සමාජයේ ආරම්භය හා සංවර්ධනය පිළිබඳ කෙටි හැඳින්වීමක් කොට, දඹදෙණි යුගයේ පැවති සංඝ පරිපාලන සැලැස්ම පිළිබඳ අධ්‍යයනයක් කරන්න.

05. පෘතුගීසි හා ලන්දේසි පාලන කාලය තුළ මෙරට ඇති වූ ශාසනික පරිහානියෙන් භික්ෂු සමාජය යහමඟට ගැනීම සඳහා වැලිවිට සරණංකර සංඝරාජ මාහිමියන් අනුගමනය කළ ක්‍රියාමාර්ග මොනවාද' යි පෙන්වා දෙන්න.

**<u>11 කොටස</u>**

06. බුදුරදුන් සතු අසීමිත ගුණ බලය හා ධර්මයේ අකාලික බව බුද්ධ කාලීන ශාසන ව්‍යාප්තියෙහිලා හේතු සාධක වූ අයුරු පැහැදිලි කරන්න.

07. නාලන්දා බෞද්ධ විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන ක්‍රමය පිළිබඳ අවධානය යොමු කරමින් එහි සිටි සුප්‍රසිද්ධ බෞද්ධ පඬිවරුන් පිළිබඳ හැඳින්වීමක් කරන්න.

08. බුදුදහමේ ආභාසයෙන් ජපන් ජනයාගේ සෞන්දර්යාත්මක චින්තනය පෝෂණය වූ ආකාරය නිදසුන් දක්වමින් පැහැදිලි කරන්න.

09. බුරුමයේ ථේරවාදී බුදුදහම දියුණු කරලීම සඳහා අනෞරත (අනුරුද්ධ) රජතුමාගෙන් ඉටු වූ සේවය ඇගයීමට ලක් කරන්න.

10. සියම් රටේ බුදුසමයට හිමි සුවිශේෂී ස්ථානය පැහැදිලි කරමින් එරට ජන ජීවිතයෙහි සෑම අංශයකටම බුදුසමය සම්බන්ධ වී ඇති ආකාරය පරීක්ෂා කරන්න.

***********************************